ඇඹිලිපිටිය කලාපය

සැකසුම-: භද්‍රා වික්‍රමසිංහ

තෙවන වාරය පාඩම් මාලාව -2020

සිංහල භාෂාව හා සාහිත්‍ය - 8 ශ්‍රේණිය

9 - සතිය

පද බෙදීම

- සංඛ්‍යාවක් ලිවීමේදී ක්‍රම දෙකක් භාවිත කරයි.
    1. සංඛ්‍යාව ඉලක්කමෙන් ලිවීම.
    2. සංඛ්‍යාව අක්ෂරවලින් ලිවීම.
- සංඛ්‍යාවක් ඉලක්කමෙන් ලිවීමේදී සෑම විටම එම සංඛ්‍යාව හා සම්බන්ධවන අක්ෂර ඉලක්කම හා එකතුකර ලිවිය යුතුය.

උදා-:• මට දෙඩම් ගෙඩි 3ක් දෙන්න.

• මෙතන රුපියල් 100ක් ඇත.

• මේ පොත රුපියල් 35කට ලබාගත හැකිය.

- සංඛ්‍යාවක් අකුරෙන් ලිවීමේදී සංඛ්‍යාවේ වචන  පිළිවෙළට වචන වෙන් කළ යුතුය.

උදා-:• 32- තිස් දෙක

• 175- එකසිය හැත්තෑ පහ

• 2984- දෙදහස් නවසිය අසූ හතර

• 65237- හැට පන්දහස් දෙසිය තිස් හත

- මේ ආකාරයට සංඛ්‍යා අකුරෙන් ලිවිමේද ස්ථානීය පද වෙන්කොට ලිවිය යුතුය.

පැවරුම්

1. පෙළපොතේ සඳහන් අභ්‍යාස කරන්න.
2. ස්ථානීය අගය පැහැදිලිව වෙන්ව දැක්වෙන ආකාරයෙන් සංඛ්‍යා 20ක් ලියා එම සංඛ්‍යා  ඉලක්කමෙන් සහ වචනයෙන් ලියන්න.